**ලංකා ගවර්මන්ට් ඉන්ෆොමේෂන් ඉන්ෆ්‍රාස්ට්‍රක්චර් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම - 2025**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ලංකා ගවර්මන්ට් ඉන්ෆොමේෂන් ඉන්ෆ්‍රාස්ට්‍රක්චර් (ප්‍රයිවට්) ලිමිටඩ් සාමාගමේ (“සමාගම”) 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තරාත්මක ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනත ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2025 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සාමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සාමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් ඉක්මවා යාම වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනය පදනම් වී ඇත්තේ මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබා ගත් විගණන සාක්ෂි මතය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත සමාගමේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,

- සමාගම සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම් පනතේ 242 වන වගන්තිය ප්‍රකාරව, මෙම සමාගම මව් සමාගම සමඟ ඒකාබද්ධ කිරීම සඳහා 2022 නොවැම්බර් 15 වන දින පැවැති මව් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමැතිය හිමිව තිබුණි. කෙසේ වෙතත්, එම ඒකාබද්ධ කිරීම සම්පූර්ණ නොවූ අතර, 2024 දෙසැම්බර් 30 වන දින පැවැති රැස්වීමේදී මෙම සමාගම ලියාපදිංචියෙන් ඉවත් කිරීමටත්, එම ඉවත් කිරීම පහසු කිරීම සඳහා එහි සියලු වත්කම් සහ බැරකම් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය වෙත පැවරීමටත් මව් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත. | **සමාගම විසින් නිරීක්ෂණය පිළිගනු ලබයි.** | සමාගම ලියාපදිංචියෙන් ඉවත් කිරීම සඳහා වූ කළමනාකාරීත්වයේ තීරණය අනුව කටයුතු කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| අ) | 2007 අංක 7 දරන සමාගම් පනත | | | |
| (i). | 116 (1) වන වගන්තිය | පසුගිය වසර 10 තුළ පවත්වන ලද සියලුම කොටස් හිමියන්ගේ රැස්වීම්වල සහ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල වාර්තා සමාගමේ ලියාපදිංචි කාර්යාලය තුළ තබා ගත යුතු වුවද, සමාගම ඒ අනුව කටයුතු කර නොමැත. | සමාගම විසින් නිරීක්ෂණය පිළිගනු ලබයි. | සමාගම් පනත ප්‍රකාරව, පසුගිය වසර 10 තුළ පවත්වන ලද සියලුම කොටස් හිමියන්ගේ රැස්වීම්වල සහ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා සමාගම විසින් එහි ලියාපදිංචි කාර්යාලය තුළ තබා ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 131(1) සහ )2) වගන්ති | කොටස් හිමියන්ගේ වාර්ෂික මහා සභා රැස්වීම පවත්වා වැඩකරන දින 30ක් ඇතුළත වාර්ෂික වාර්තාව සමාගම් රෙජිස්ටාර් වෙත භාරදිය යුතුය. කෙසේ වෙතත්, 2012 වසරේ සිට වාර්ෂික වාර්තා සමාගම් රෙජිස්ටාර් වෙත භාරදී නොමැත. | සමාගම විසින් නිරීක්ෂණය පිළිගනු ලබයි. | සමාගම් පනත ප්‍රකාරව, කොටස් හිමියන්ගේ වාර්ෂික මහා සභා රැස්වීම පවත්වා වැඩකරන දින 30 ක් ඇතුළත වාර්ෂික වාර්තාව සමාගම් රෙජිස්ටාර් වෙත භාරදිය යුතුය. |
| (iii) | 223(3) (ඇ) වන වගන්තිය | සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය හෝ ලේකම්වරුන් වෙනස් වන්නේ නම්, එකී වෙනස්වීම සිදු වූ දින සිට වැඩකරන දින 20ක් ඇතුළත ඒ පිළිබඳ සමාගම් රෙජිස්ටාර් වෙත දැනුම් දිය යුතුය. කෙසේ වෙතත්, 2019 ජූනි 19 වන දිනෙන් පසුව අධ්‍යක්ෂ මණ්ඩලයේ සිදුවූ වෙනස්වීම් සමාගම් රෙජිස්ටාර් හමුවේ ලියාපදිංචි කර නොමැත. | සමාගම විසින් නිරීක්ෂණය පිළිගනු ලබයි | සමාගම් පනත ප්‍රකාරව, සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ ලේකම්වරුන්ගේ සිදුවන වෙනස්වීම් එම වෙනස්වීම සිදු වූ දින සිට වැඩකරන දින 20ක් ඇතුළත සමාගම් රෙජිස්ටාර් වෙත ඉදිරිපත් කළ යුතුය. |
| b) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ චක්‍රලේඛයේ 2.2.2 ඡේදය | සමාගමේ සභාපති විසින් අවම වශයෙන් මසකට වරක්වත් නිතිපතා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වන බවට සහතික විය යුතු වේ. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ සමාගම විසින් එක් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් පමණක් පවත්වා ඇත. | සමාගම විසින් නිරීක්ෂණය පිළිගනු ලබයි | අවම වශයෙන් මසකට වරක්වත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්විය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය ශුන්‍ය විය. සමාලෝචිත වර්ෂය තුළ කිසිදු ගනුදෙනුවක් සිදු නොවීම මෙම තත්ත්වයට හේතුව විය.

## 3. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 3.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය | සමාගම විසින් නිරීක්ෂණය පිළිගනු ලබයි | චක්‍රලේඛයට අනුකූලව, මූල්‍ය වර්ෂය අවසන් වී දින හැටක් |

| | | |
|---|---|---|
| ව්‍යවසාය චක්‍රලේඛයේ මෙහෙයුම් මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.6 ඡේදයට අනුව, මූල්‍ය වර්ෂය අවසන් වී දින හැටක් (60) ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ ගිණුම් විගණකාධිපති වෙත භාරදිය යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමාගම විසින් භාරදී ඇත්තේ දින 118 කට පසුවය. | | (60) ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ ගිණුම් විගණකාධිපති වෙත භාරදිය යුතුය. |

**3.2 විගණන කමිටුව**

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2010 දෙසැම්බර් 14 දිනැති අංක PED 55 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 15 වන ඡේදයට අනුව, විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් අවම වශයෙන් මාස තුනකට වරක්වත් පැවැත්විය යුතුය. කෙසේ වෙතත්, ඒ අනුව කටයුතු කර නොමැත. | සමාගම විසින් නිරීක්ෂණය පිළිගනු ලබයි. | චක්‍රලේඛය ප්‍රකාරව, විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් අවම වශයෙන් මාස තුනකට වරක්වත් පැවැත්විය යුතුය. |